සියලු ම හිමිකම් ඇවිරිණි

කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම Educational Zonel Office- Mathugama

# මතුගම අධ්‍යාපන කලාපය

| කෘෂිකර්මය හා ආහාර තාක්ෂණය | දෙවන වාර පරීක්ෂණය 2020 | 11 ශ්‍රේණිය |
|---|---|---|

ශිෂ්‍ය / ශිෂ්‍යාවගේ නම ......................................................................

කාලය පැය 03 කි
අමතර කියවීමේ කාලය
මිනිත්ත 10

## I කොටස

**සැ: යු: (i) සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**(ii) අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

**(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

**(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා පිළිපදින්න.**

---

01. තම පවුලේ පෝෂණය සඳහා වී ඇතුලු වෙනත් අතිරේක ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ගොවිතැන් ක්‍රමය වන්නේ,
(1) වානිජ ගොවිතැනයි. (2) කාබනික ගොවිතැනයි.
(3) යැපුම් ගොවිතැනයි. (4) සමෝධාන ගොවිතැනයි.

02. එක් වැවකින් පෝෂණය වන ප්‍රදේශය රට පහළින් ඇති වැව්වල පෝෂිත ප්‍රදේශය වන ආකාරයට සකස් කළ පද්ධතිය හඳුන්වන්නේ,
(1) ජල සම්පාදන පද්ධතිය ලෙසය. (2) එල්ලංගා පද්ධතිය ලෙසය.
(3) ජලවහන පද්ධතිය ලෙසය. (4) වාරි පද්ධතිය ලෙසය.

03. පැරකුම් රජ දවස විශාල ධාන්‍ය නිෂ්පාදනයක් පැවති බවත් ඒවා අපනයනය කළ බවත් ජනප්‍රවාදයෙහි සඳහන් වේ. මෙයින් හැඟී යන්නේ,
(1) ශ්‍රී ලංකාවේ ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් පැවති බවයි.
(2) ශ්‍රී ලංකාවේ ජනයා ධාන්‍ය පරිභෝජනය නොකළ බවකි.
(3) ශ්‍රී ලංකාවේ වෙනත් බෝග වගා කර නැති බවයි.
(4) ශ්‍රී ලංකාවේ ධාන්‍ය භාවිතා කරන කර්මාන්ත නොතිබුණ බවයි.

04. ශ්‍රී ලංකාව කෘෂි පාරිසරික කලාප 46 කට බෙදා වෙන් කර දක්වයි. තෙත් කලාපය තුළ දක්නට ලැබෙන කෘෂි පාරිසරික කලාපප සංඛ්‍යාව වන්නේ,
(1) 11 කි. (2) 15 කි. (3) 20 කි. (4) 24 කි.

05. වියළි කලාපයේ බහුලව දක්නට ලැබෙන පාංශු කාණ්ඩය වන්නේ,
(1) රතු කහ පොඩ්සොලික පස වේ. (2) දියළු පස වේ.
(3) රතු කහ ලැටසොල් පස වේ. (4) රතු දුඹුරු පස වේ.

06. බෑවුම් භූමියක සමෝච්ඡ ස්ථාන ලකුණු කිරීමට භාවිතා කරන උපකරණයකි,
(1) ලම්බය (2) A රාමුව (3) ලෙවල් බටය (4) කුඤ්ඤය

07. ඇබේසියේ කුලයේ බොහෝ ශාකවල මූල ගැටිති දක්නට ලැබේ. මෙම මූල ගැටිති තුළ ජීවත් වන්නේ,
(1) නයිට්‍රොසොමනාස් බැක්ටීරියාවයි. (2) නයිට්‍රොබැක්ටර්
(3) රයිසෝබියම් බැක්ටීරියාවයි. (4) සියුඩොමොනාස් බැක්ටීරියාව වේ.

08. තවාන් පැළවලට බහුලව වැළඳෙන දිලීර රෝගයක් වන්නේ,
(1) පත්‍ර විචිත්‍ර වෛරස් රෝගය (2) දියමලන් කැමේ රෝගය
(3) කොළ පාළුව (4) මූල ගැටිති රෝගය

09. පහත රට තෙත් කලාපයේ පොලිතීන් ගෘහ තුළ උෂ්ණත්ව පාලනය කිරීමට යොදා ගන්නා උපක්‍රමය වන්නේ,
(1) පංකා සවි කිරීමයි. (2) මුදුන් වා කවුළු දැමීමය.
(3) සිසිලන ක්‍රම භාවිතා කිරීමය. (4) ඉහත සියළුම ක්‍රම වේ.

10. ඒකීය සූර්ය ප්‍රචාරකයක් තුළ දඬු කැබලි මුල් ඇදීම වේගවත් වන්නේ,
(1) උෂ්ණත්වය වැඩි වීම නිසාය. (2) ආර්ද්‍රතාවය වැඩි වීම නිසාය.
(3) ආලෝක තීව්‍රතාවය වැඩි වීම නිසාය. (4) උෂ්ණත්වය සහ ආර්ද්‍රතාවය වැඩි වීම නිසාය.

11. වියළි කලාපීය හේන් ගොවිතැනේදී කැලෑ එළි පෙහෙළි කරන කාල සීමාව වන්නේ,
(1) ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා (2) දෙසැම්බර් සිට ජනවාරි දක්වා
(3) ජූලි සිට අගෝස්තු දක්වා (4) ජනවාරි සිට මාර්තු දක්වා

12. වායව අතු බැඳීම යෝග්‍ය වන්නේ,
(1) පොළොවට නැමීමට පහසු අතු සහිත ශාක සඳහා ය.
(2) පොළවට නැමීමට අපහසු අතු සහිත ශාක සඳහා ය.
(3) පොත්ත ගැලවීමට පහසු අතු සහිත ශාක සඳහා ය.
(4) පොත්ත ගැලවීමට අපහසු අතු සහිත ශාක සඳහා ය.

13. ස්වභාවික වර්ධක ප්‍රචාරණ ව්‍යුහ අඩංගු පිළිතුර වන්නේ,
(1) පත්‍ර කැබලි, මුල් කැබලි සහ දඬු කැබලි (2) රෛසෝමය, කෝමය, ස්කන්ධ ආකන්ද
(3) ලේයර් පැල, බල්බිල සහ මොරෙයියන් වේ. (4) බද්ධ පැල, මොටියන් සහ බල්බය වේ.

14. පහත සඳහන් බෝග අතරින් බල්බිල මගින් පැළ බෝ කරන බෝගය වන්නේ,
(1) දේශීය වැල අල (කොඩොල් අල) (2) ඉඟුරු වේ.
(3) රතු ළූණු වේ. (4) අර්තාපල් වේ.

15. පටක රෝපණයේ වාසියක් නොවන්නේ,
(1) කුඩා ශාක කොටසකින් විශාල පැළ සමූහයක් ලබා ගැනීම වේ.
(2) වෛරස් ආසාධිත ශාකවලින් නිරෝගී පැළ ලබා ගැනීම වේ.
(3) සර්ව සම පැල (ක්ලෝන) ලබා ගැනීම.
(4) වියදම අඩු ලාභදායී ක්‍රමයක් වීම.

16. බීජ ප්‍රරෝහණ ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂණයකදී ශිෂ්‍යයෙකු ලබා ගත් පාඨාංක පහත දැක්වේ.
පැළ වීමට දැමූ බීජ සංඛ්‍යාව - 50
පැළ වූ බීජ සංඛ්‍යාව - 46
මෙම බීජ සාම්පලයේ ප්‍රරෝහණ ප්‍රතිශතය වන්නේ,
(1) 75% (2) 85% (3) 90% (4) 92%

17. ඉහත බීජ තොගය වැපිරීමට,
(1) යෝග්‍ය වේ. (2) යෝග්‍ය නොවේ.
(3) වැඩි බීජ ප්‍රමාණයක් අවශ්‍ය වේ. (4) අඩු බීජ ප්‍රමාණයක් අවශ්‍ය වේ.

18. පහත දැක්වෙන ප්‍රකාශවලින් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) ආකන්ද වර්ධනයට රාත්‍රී උෂ්ණත්වය වැඩි වීම යෝග්‍ය වේ.
(2) දිගු දින ශාක වගා කිරීමට යල කන්නය සුදුසු වේ.
(3) රාත්‍රී කාලයේ ප්‍රභාසංස්ලේෂණය සිදු නොවන අතර ශ්වසනය සිදු වේ.
(4) ප්‍රභාසංස්ලේෂණයෙන් ආහාර නිපදවන අතර ශ්වසනයේ දී ආහාර වැය වේ.

19. කැරට් බීජ සහ ගෝවා වැනි ශාකවලට ශීත තත්ත්ව ලබා දුන් විට පුෂ්පීකරණය උත්තේජනය වේ. මෙය,
(1) ප්‍රභා අවධි සංවේදීතාවය නම් වේ. (2) ප්‍රකාශ වර්තීතාව නම් වේ.
(3) වසන්තීකරණය නම් වේ. (4) පරිසංක්‍රමණය නම් වේ.

20. දේශගුණික සාධකයක් වන සුළඟේ වේගය මැනීමට භාවිතා කරන්නේ,
(1) උෂ්ණත්වමානය වේ. (2) සුළං දිශා දර්ශකය වේ.
(3) අනිල මානය වේ. (4) තෙත් හා විළි බල්බ උෂ්ණත්වමානය වේ.

21. යල සහ මහ කන්නයේ අස්වනු නෙලීමේ මාස පිළිවෙලින්,
(1) පෙබරවාරි සහ අගෝස්තු වේ. (2) අප්‍රේල් සහ දෙසැම්බර් වේ.
(3) දෙසැම්බර් සහ අප්‍රේල් වේ. (4) අගෝස්තු සහ පෙබරවාරි වේ.

22. පසේ කැටායන හුවමාරු ධාරිතාව සඳහා කලිල අංශු වැදගත් වේ. පසේ කලිල ලෙස ක්‍රියා කරන අංශු වන්නේ,
(1) වැලි අංශු වේ. (2) මැටි අංශු වේ.
(3) හියුමස් අංශු වේ. (4) මැටි සහ හියුමස් අංශු වේ.

23. අංශුවල විෂ්කම්භය අනුව පස් අංශු වර්ගීකරණය කෙරේ. 0.02mm - 0.002mm අතර පරාසයක විෂ්කම්භය සහිත අංශු හඳුන්වන්නේ,
(1) වැලි අංශු ලෙසය. (2) බොරළු අංශු ලෙසය.
(3) රොන් මඩ අංශු ලෙසය. (4) මැටි අංශු ලෙසය.

24. ධාන්‍ය බීජ ගබඩා කිරීමට සුදුසු තෙතමන ප්‍රතිශතය වන්නේ,
(1) 5% - 6% වේ. (2) 12% - 14% වේ.
(3) 20% - 22% වේ. (4) 25% - 27% වේ.

25. ශිෂ්‍ය කණ්ඩායම් හතරකට ලබා දුන් අඹ බීජ ප්‍රරෝහණය වේගවත් කිරීමට පහත ප්‍රතිකර්ම සිදු කර ලදී.
A - බීජ ජලයේ පොඟවා සිටුවීම. B - බීජ පොත්ත පළුදු කර සිටුවීම.
C - උණු ජලයේ ගිල්වා සිටුවීම. D - තනුක බීජ සල්ෆියුරික් අම්ලයේ ගිල්වා සිටුවීම.
ඉක්මනින් බීජ පැලවූයේ කුමන කණ්ඩායමේ ද?
(1) A කණ්ඩායම (2) B කණ්ඩායම
(3) C කණ්ඩායම (4) D කණ්ඩායම

26. ශාකයට ලබා ගත හැකි ''ජලය'' ලෙස සලකනු ලබන්නේ,
(1) සංතෘප්ත අවස්ථාවේ සිට ක්ෂේත්‍ර ධාරිතාව තෙක් ජලය වේ.
(2) ක්ෂේත්‍ර ධාරිතාවයේ සිට තාවකාලික මැලවුම් අංකය තෙක් ජලය වේ.
(3) ක්ෂේත්‍ර ධාරිතාවයේ සිට ස්ථිර මැලවුම් අංකය තෙක් ජලය වේ.
(4) සංතෘප්ත අවස්ථාවේ සිට ස්ථිර මැලවුම් අංකය තෙක් ජලය වේ.

27. බහුස්ථර බෝග වගා පද්ධතියක නිවාස ආසන්නයේ වගා කර ඇති බෝග කාණ්ඩ වන්නේ,
(1) පැලෑටි වේ. (2) පඳුරු වේ.
(3) මධ්‍යස්ථ උස ශාක වේ. (4) උස ශාක වේ.

28. කඩින් කඩ බෝග වගාවේදී A සහ B ලෙස බෝග දෙකක් යොදා ගනී. සත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) A සහ B බෝග දෙකම එකවර වගා කෙරේ.
(2) A බෝගය වගා කර අස්වනු නෙලා B බෝගය වගා කෙරේ.
(3) B බෝගය වගා කර අස්වනු නෙලීමෙන් පසු A බෝගය වගා කෙරේ.
(4) A බෝගය වගා කර මල් පිපී ගෙන එන විට අතර ඉඩ පරතරයෙහි B බෝගය වගා කෙරේ.

29. සංරක්ෂණය ගොවිතැන් ප්‍රධාන අරමුණ වන්නේ,
(1) පස සංරක්ෂණය වේ. (2) ජෛව විවිධත්වය සංරක්ෂණය වේ.
(3) ජලය සංරක්ෂණය වේ. (4) පස, ජෛව විවිධත්වය , ජලය සංරක්ෂණය වේ.

30. ධාන්‍ය බෝගවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා අස්වනු නෙලීමට වඩා සුදුසු අවස්ථාව වන්නේ,
(1) පත්‍ර රන්වන් පාට වූ අවස්ථාව
(2) කරලේ බීජවලින් 85% ක් අන්වන් පාට වූ අවස්ථාව වේ.
(3) කරල් සම්පූර්ණයෙන් පිරුණු අවස්ථාව වේ.
(4) කරලේ බීජ 100% ක් රන්වන් පාට වූ අවස්ථාව වේ.

31. අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) එළවළු සහ පලතුරු ප්‍රවාහනය සඳහා පොලිතින් බෑග් වෙනුවට ප්ලාස්ටික් කුඩ වඩා සුදුසු වේ.
(2) එළවළු හා පලතුරු වැඩි ආර්ද්‍රතාවයක් සහ අඩු උෂ්ණත්වයක් යටතේ දිගු කාලයක් ගබඩා කළ හැකි වේ.
(3) උදය සහ රාත්‍රී කාලයේ එළවළු සහ පලතුරු ප්‍රවාහනය කිරීමෙන් උෂ්ණත්වය නිසා නාස්ති වේ.
(4) වෙළඳපොළ තුළ එළවළු සහ පලතුරු පාරිභෝගිකයාට සිත් ගන්නා ආකාරයට අපද්‍රව්‍ය සහ අහිතකර තත්ත්වවලට භාජනය නොවන පරිදි අසුරා තැබිය යුතුයි.

32. බීජ පැලවලට පොහොර යෙදීමේ වඩා සුදුසු ක්‍රමය වන්නේ,
(1) ශාකය වටා අර්ධ කවා කාරව පොහොර තැන්පත් කිරීම.
(2) ශාකය වටා කවාකාරව පොහොර තැන්පත් කිරීම.
(3) පැල පේළි අතර පොහොර විසුරුවා හැරීම.
(4) 1% සාන්ද්‍රණයෙන් ද්‍රාවණයක් ලෙස ශාකය නැහැවෙන පරිදි පොහොර තැන්පත් කිරීම.

33. වල් පැලෑටි මර්ධනය සඳහා යොදා ගන්නා යාන්ත්‍රික ක්‍රමයක් වන්නේ,
(1) උදැල්ල භාවිතා කර වල් මර්ධනය කිරීම.
(2) ජලයෙන් යට කිරීම.
(3) වල් බීජවලින් තොර රෝපණ ද්‍රව්‍ය භාවිතා කිරීම.
(4) රසායනික වල් නාශක යෙදීම.

34. ආහාර නරක් වීමට බලපාන සාධක කීපයක් පහත දක්වේ.
A - යාන්ත්‍රික හානි සිදු වීම. B - ඉහළ උෂ්ණත්යටෙ නිරාවරණය වීම.
C - මුදු වීම. D - පළිබෝධනාශක අවශේෂ එකතු වීම.
ඉහත සාධක අතරින් ආහාර නරක් වීම කෙරේ බලපාන රසායනික සාධක වන්නේ,
(1) A හා C වේ. (2) B හා C වේ. (3) C හා D වේ. (4) A හා D වේ.

35. ජලගත වගාව ආදර්ශනය කිරීම සඳහා ශිෂ්‍යයෙකු සෘජුෆෝම් පෙට්ටියක් භාවිතා කළේය. ඔහු එහි ඇතුළත කළු පොලිතීන් වලින් ආවරණය කරන ලදී. මෙහි අරමුණ වන්නේ,
(1) කළු පොලිතීන් මගින් තාපය අවශෝෂණය කිරීම.
(2) පෝෂක ද්‍රාවණය කාන්දු වීම වැළැක්වීමය.
(3) මුල් වර්ධනයට අඳුරු පරිසරයක් ලබා දීමය.
(4) සෘජුෆෝම් වල අඩංගු විෂ ද්‍රව්‍ය ද්‍රාවණයට පැමිණීම වැළැක්වීමය.

36. නිර්පාංශු බෝග වගාවේ දී බහුලව භාවිතා කරන පෝෂක මාධ්‍ය වන්නේ,
(1) ඇලන් සහ කූපර්ගේ ද්‍රාවණය වේ. (2) ඇල්බට් මිශ්‍රණය වේ.
(3) හයිපොනෙක්ස් මිශ්‍රණය වේ. (4) මැක්සික්‍රොප් මිශ්‍රණය වේ.

37. සමබල ආහාරයක ශක්තිජනක ආහාර, වර්ධක ආහාර සහ ආරක්ෂක ආහාර අඩංගු කළ යුතුය. ශක්තිජනක ආහාර පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.
(1) බත්, මාළු, ගොටුකොළ (2) පාන්, පරිප්පු, නිවිති
(3) බත්, අර්තාපල්, මඤ්ඤොක්කා (4) පාන් , මස් , අර්තාපල්

38. වැඩිම ශක්තිජනක ආහාර ප්‍රමාණයක් අවශ්‍ය වන්නේ,
(1) බර වැඩ කරන පිරිමින්ට (2) රෝගී කාන්තාවන්ට
(3) බර වැඩ කරන ගැහැණු අයට (4) කාර්යාල නිලධාරීන්ට

39. යම් කිසි භූමියක එකම අවස්ථාවේ බෝග කීපයක් අක්‍රමවත්ව වගා කිරීම හඳුන්වන්නේ,
(1) කඩින් කඩ බෝග වගාව ලෙසය. (2) මිශ්‍ර බෝග වගාව ලෙසය.
(3) අතුරු බෝග වගාව ලෙසය. (4) වීදි බෝග වගාව ලෙසය.

40. වර්තමානයේ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ දැඩි අවධානයක් යොමු වී ඇත. ආහාර සුරක්ෂිතතාව යනු,
(1) ආහාරවලට සාධාරණ මිලක් ලබා දීමයි.
(2) ආහාර නරක් නොවී දීර්ඝ කාලයක් ගබඩා කර තබා ගැනීමයි.
(3) අවශ්‍ය අවස්ථාවලදී අවශ්‍ය ප්‍රමාණවලින් ගුණාත්මක ආහාර ලබා ගැනීමේ හැකියාවයි.
(4) ආහාර හිඟ රටවලට ලබා දීමයි

කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම Educational Zonel Office- Mathugama

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය**

ශිෂ්‍ය / ශිෂ්‍යාවගේ නම ..............................................................................

## II කොටස

**සැ: යු: පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. ව්‍යාපාරික ගොවි මහතෙක් කෘෂි ව්‍යාපාරයක් ආරම්භ කිරීම සඳහා කළුතර දිස්ත්‍රික්කයෙන් හෙක්ටයාර 2 ක ඉඩමක් මිලදී ගන්නා ලදී. එම භූමිය ඒකාකාර නොවූ අතර කොටසක් ගල්පර සහිත බෑවුම් භූමියක් විය. ඉඩමේ පහළ ප්‍රදේශය ජල වහනය දුර්වලය. ඉඩම වැඩි ප්‍රදේශයක් සාරවත් තැනිතලා භූමියකි. විවිධ වගා රටාවන් අනුගමනය කරමින් කවුපි, බඩ ඉරිඟු, වම්බටු, මාලු මිරිස් , වී , මෑ , බතල , දඹල , කොහිල , වැටකොළු , කරවිල , බණ්ඩක්කා වැනි බෝග වගා කිරීමට අදහස් කරයි.

1. a) මෙම ඉඩම අයත් වන දේශගුණික කලාපය නම් කරන්න.
   b) මෙම ප්‍රදේශයට ලැබෙන වර්ෂාපතනයේ ප්‍රමාණය කොපමණද?
2. ඉඩමේ සාරවත් කොටසේ සිව් බෝග මාරු ක්‍රමයට බෝග වගා කිරීමට අදහස් කරයි. ඒ සඳහා යොදා ගත හැකි බෝග 4 ක් සඳහන් කරන්න.
3. a) දුර්වල ජල වහන සහිත කොටසේ බෝග වගා කිරීමේදී මතු විය හැකි ගැටලු දෙකක් නම් කරන්න.
   b) මෙහි ජල වහනය දියුණු කිරීමට සුදුසු ක්‍රමයක් යෝජනා කරන්න.
4. ඔහු වගා කිරීමට බලාපොරොත්තු වන බෝග අතුරින් පහත සඳහන් ශාක කුල වලට අයත් වන බෝගය බැගින් නම් කරන්න.
   a) පොඒසියේ b) සොලනේසියේ c) ෆැබේසියේ d) ක්‍යුකර්බිටේසියේ
5. a) ඉඩමේ මායිම සීමා කරන වැටට යොදා ගන්නා කප්පාදු කළ හැකි ශාක වර්ග දෙකක් නම් කරන්න.
   b) කප්පාදුවෙන් ඉවත ලන ශාක කොටස් ප්‍රයෝජනයට ගත හැකි ආකාර දෙකක් යෝජනා කරන්න.
6. a) ඔහු තෝරා ගන්නා බෝග අතරින් තවාන් දමා සිටුවන බෝග වර්ග දෙකක් නම් කරන්න.
   b) තවාන් දැමීමට බහුලව යොදා ගන්නා තවාන් වර්ග දෙකක් නම් කරන්න.
7. ගල් පර සහිත නිසරු භූමිය සත්ව පාලන කටයුත්තකට යොදා ගැනීමට අදහස් කරයි. මෙහි ඇති කළ හැකි කිරි ගව වර්ග දෙකක් නම් කරන්න.
8. ඉඩමේ පහත් භූමියේ පොකුණක් සාදා එහි ලී කණු සිටුවා ඒ මත ලී තට්ටුවක් සාදා ඇත.
   a) පොකුණ යොදා ගත හැක්කේ කුමන කටයුත්තක් සඳහා ද?
   b) ලී තට්ටුව මත කොටුවක් සාදා එහි ඇති කළ හැකි ජලය ප්‍රිය කරන සත්ව වර්ගයක් නම් කරන්න.
9. මෙම භූමියේ සියලුම අපද්‍රව්‍ය එකතු කර ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට බලාපොරොත්තු වේ. අපද්‍රව්‍ය භාවිතා කරමින් යොදා ගන්නා කෘෂි නිෂ්පාදන අංශ දෙකක් නම් කරන්න.
10. a) මෙම වගා පද්ධතිය හැඳින්වීමට සුදුසු නමක් යෝජනා කරන්න.
    b) මෙම වගා පද්ධතියෙන් ගොවියාට ලැබෙන වාසි දෙකක් දක්වන්න.

02. ඉහළ බෝග සංස්ථාපනයක් සහ මනා බෝග වර්ධනයක් ලබා ගැනීම සඳහා බිම සකස් කිරීම සහ ගුණාත්මක බීජ භාවිතය වැදගත් වේ.

1. a) බිම් සකස් කිරීමේ අරමුණු තුනක් නම් කරන්න.
   b) ප්‍රාථමික බිම් සකස් කිරීම ද්විතියික බිම් සකස් කිරීම සහ අතුරු යත් ගෑම සඳහා යොදා ගන්නා උපකරණ එක බැගින් නම් කරන්න.
2. සිටුවීමට සුදුසු බීජ සාම්පලයක තිබිය යුතු ලක්ෂණ හතරක් නම් කරන්න.
3. a) බීජ සාම්පලයක ප්‍රරෝහණ ප්‍රතිශතය සොයන ක්‍රමයක් නම් කරන්න.
   b) එම ක්‍රමය භාවිතා කර බීජ සාම්පලයක ප්‍රරෝහණ ප්‍රතිශතය සොයන ආකාරය විස්තර කරන්න.

03. කෘෂි කාලගුණික මධ්‍යස්ථානයක පහත සඳහන් උපකරණ ස්ථාපනය කර තිබුණි. සමහර උපකරණ එළිමහනේ සවි කර තිබූ අතර සමහර උපකරණ ස්ටීවන්සන් ආවරණය නම් වූ ව්‍යුහය තුළ ස්ථාපනය කර තිබුණි.




A



B




C

1. A,B,C උපකරණ නම් කර එක් එක් උපකරණය මගින් මැන ගන්නා කාලගුණ පරාමිතිය දක්වන්න.
2. a) A නම් වූ උපකරණය මගින් ලබා ගන්නා තොරතුරු ගොවි මහතෙකුට වැදගත් වන්නේ කෙසේද?
   b) B උපකරණය පිහිටුවීමේදී සැලකිය යුතු සාධක දෙකක් නම් කරන්න.
3. a) දිවා කාලයේ දිග කෙරෙහි ශාක දක්වන ප්‍රතිචාරය අනුව බෝග කාණ්ඩ දෙකකි. ඒවා නම් කරන්න.
   b) එක් එක් කාණ්ඩය සඳහා උදාහරණ දෙක බැගින් දක්වන්න.

04. බෝග අස්වනු කන්නයකට පමණක් ලැබෙන නිසා වසර පුරා පරිභෝජනයට පරිරක්ෂණය කර ගබඩා කිරීම අත්‍යවශ්‍ය වේ.
1. a) බෝග අස්වනු නරක් වීමට බලපාන සාධක දෙකක් නම් කරන්න.
   b) නරක් වූ ආහාරයක් හඳුනා ගත හැකි ලක්ෂණ හතරක් දක්වන්න.
2. පහත සඳහන් පරිරක්ෂණ මූලධර්ම භාවිතා කර කල් තබා ගන්නා අස්වනු වර්ග දෙක බැගින් නම් කරන්න.

| | |
|---|---|
| a) විජලනය | b) අඩු උෂ්ණත්ව භාවිතය |
| c) pH වෙනස් කිරීම | d) පරිරක්ෂක භාවිතා කිරීම |

3. a) වී වගාවේ පවතින වල් පැලෑටි වර්ග 3 ක් නම් කරන්න.
   b) වී වගාවට හානි කරන කෘමීන් දෙදෙනෙකු නම් කර හානිය බැගින් ලියන්න.
   c) වී වගාවේ අස්වැන්න නෙළීමට සුදුසු අවස්ථාව කුමක්ද?

05. අහිතකර දේශගුණික සාධක මගින් බෝග වලට සිදුවන හානි අවම කිරීම සඳහා ශාක ප්‍රචාරක ව්‍යුහ භාවිතා කෙරේ.
1. බහුලව භාවිතා කරන ශාක ප්‍රචාරක ව්‍යුහ වර්ග 3 ක් නම් කරන්න.
2. ශාක ප්‍රචාරක ව්‍යුහ තුළ බෝග වගා කිරීමෙන් ලැබෙන වාසි 3 ක් දක්වන්න.
3. නිර්පාංශු බෝග වගාව නාගරික කෘෂි කර්මාන්තයේ දී භාවිතා කරන ජනප්‍රිය වගා ක්‍රමයකි.
   a) ඝන මාධ්‍ය බෝග වගාවේ දී භාවිත කරන වගා තාක්ෂණික ක්‍රම දෙකක් නම් කරන්න.
   b) ඝන මාධ්‍ය ලෙස බහුලව භාවිතා කරන මාධ්‍ය දෙකක් නම් කරන්න.
   c) ද්‍රව මාධ්‍ය බෝග වගා කිරීමේදී පෝෂක ද්‍රාවණ ලෙස යොදා ගත හැකි පොහොර මිශ්‍රණ දෙකක් නම් කරන්න.

06. ගොවි මහතෙකු විසිතුරු මල් පැළ සහ පලතුරු පැළ නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් ආරම්භ කළේය.
1. ඔහු දඬු කැබලි භාවිතා කරමින් පැළ නිෂ්පාදනය කළේය. ඒ සඳහා භාවිතා කළ දඬු කැබලි වර්ග තුනක් නම් කරන්න.
2. දඬු කැබලි වල මුල් ඇද්දවීම සාර්ථක කර ගැනීමට ඔහුට යොදා ගත හැකි උපක්‍රම දෙකක් යෝජනා කරන්න.
3. පළතුරු පැළ බද්ධ කිරීමට රිකිලි බද්ධය තෝරා ගත් අතර ඔහු භාවිතා කරන ලද රිකිලි බද්ධ ක්‍රමයක් නම් කර එහි පියවර රූප සටහනක් මගින් දක්වන්න.

07. පාංශු තෙතමනය ප්‍රශස්තව පවත්වා ගැනීම බෝග වර්ධනය වේගවත් වන අතර ඉහළ අස්වැන්නක් ලබා ගත හැකි වේ.
1. a) පසේ ප්‍රශස්ත තෙතමනය, පවතින අවස්ථාව හඳුන්වන්නේ කෙසේද?
   b) එම අවස්ථාවේ පසේ පවතින ජල වර්ග දෙක නම් කරන්න.
2. a) ආම්ලික පස බෝග වර්ධනයට යෝග්‍ය නොවේ. පස ආම්ලික වීමට හේතු දෙකක් දක්වන්න.
   b) ආම්ලික පස පුනරුත්තාපනය කිරීමට පසට යෙදිය යුතු ද්‍රව්‍ය දෙකක් නම් කරන්න.
3. ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා කෘෂි කර්මාන්තය වැදගත් වන ආකාර තුනක් දක්වන්න.